**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය - 2023**

**--------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී **ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ** අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වැඩිහිටි මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 134 | ආයතනයේ මුදල් හා ගිණුම් කටයුතු ඉටුකිරීමෙහි නියුක්ත අයගේ පාලනයෙන් අභ්‍යන්තර විගණක නිදහස් විය යුතු වුවත් අභ්‍යන්තර විගණක විසින් වෙනත් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් විවිධ ගෙවීම් සඳහා අත්තිකාරම් ලබාගැනීම සිදු කර තිබුණි. | ඉදිරියට වෙනත් කාර්යයන් සඳහා අත්තිකාරම් ලබා නොගන්නා ලෙස උපදෙස් ලබා දී ඇති බව. | මුදල රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචන**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 16,039,452 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් ඌනතාවය රු. 9,350,017 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,689,435 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුනරාවර්තන ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි

.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු. 51,713,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, රු. 15,381,188 ක් වූ වත්කම් (ඉන්වෙන්ට්‍රි) වලින් සමන්විත වායු සමීකරණය කරන ලද කාමර 6 කින් යුත් සංචාරක බංගලාව කතරගම පූජා නගරයට ආසන්නයේ මැණික් ගඟ අසල ඉතාමත් සුන්දර ස්ථානයක පිහිටා ඇත අතර සංචාරකයින්ගේ ආකර්ෂණය නොඅඩුව ලබා ගත හැකි මෙම ස්ථානය වසර 2 ක පමණ කාලයක සිට කිසිදු ආදායමක් උපයා ගෙන නොතිබුණි. වැඩිහිටි නිවාසයට අනුයුක්ත කර ඇති වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ නිලධාරින් විසින් උඩුමහල සම්පූර්ණයෙන්ම හා පහත මහලේ කාමරයක සිය පවුලේ සාමාජිකයින්ද සමඟ වාසය කිරීම ආදායම අහිමි වීමට ප්‍රධාන හේතු වී තිබුණි. නියැදි පරීක්ෂාවට ලක් වූ 2023 වර්ෂයේ ජූලි ,අගෝස්තු හා සැප්තැම්බර් යන මාස 03 ක සංචාරක නිවාසයේ විදුලිය හා ජලය පරිහරණය වෙනුවෙන් වියදම රු 143,799 ක් වුවද සංචාරක නිවාසයේ දැනට පදිංචි නිලධාරීන්ගෙන් කිසිදු මුදල් අයකිරීමකින් තොරව සංචාරක බංගලාව සිය පරිහරණය සඳහා ලබා දී තිබුණි. | කොවිඩ් වසංගත තත්වය පවතින කාල සීමාවේදී සංචාරකයන් හට මෙම සංචාරක නිකේතනය ලබා නොදීම නිසා හා නිල නිවාසය සම්පූර්ණයෙන් කඩා ඉවත් කල නිසාත් නිල නිවාසයේ සිය පවුලේ සාමාජිකයන් සමඟ ජීවත්ව සිටි බැවින් සිය පවුලේ සාමාජිකයන් ද සමඟ වාසය කිරිමට ලබා දී ඇත.<br>එම නිවාසයේ නිලධාරින්ගේ භාවිතය සඳහා ලබා දුන් දින සිටම සමාජ ආරක්ෂණ අරමුදලින් හෝ රාජ්‍ය අරමුදල් යොදා ගෙන ජල හෝ විදුලි බිල්පත් කිසිවක් ගෙවීම හෝ ප්‍රතිපූර්ණය කර නොමැති බව. | ලැබෙන අරමුදල් වැඩිහිටි සුභ සාධනය සඳහා යොදා ගත යුතු අතර නිලධාරියන්ට නිවාසය ලබා දීම ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු කළ යුතුය. |
| (ආ) | පනතේ 1 කොටසේ 2 වගන්තිය ප්‍රකාරව වැඩිහිටි තැනැත්තන් සඳහා ජාතික සභාව පිහිටුවා තිබුණි. නියැදි පරීක්ෂාවට ලක් වූ පසුගිය හා සමාලෝචිත වර්ෂ වලදී ජාතික සභාව විසින් වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සැකසීම, වැඩහිටි සෞඛ්‍ය රක්ෂණ වැඩසටහනක් සකස් කිරීම, සියළුම වැඩිහිටි නිවාස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි කර අවසන් කිරීම, වැඩිහිටි සත්කාරක සේවා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම, මානසික රෝගී වැඩිහිටියන් සඳහා උපදේශ සේවාවන් සැපයීම ආදී වශයෙන් ගනු ලැබූ වැදගත් තීරණ මෙම වාර්තාවේ දිනය දක්වා | ජාතික වැඩිහිටි ප්‍රතිපත්තියෙහි කෙටුම්පත සකස් කරමින් පවතින බවත්, රක්ෂණාවරන වැඩසටහනේ මූලික කටයුතු සිදුකරමින් පවතින බවත්,2024 සැප්තැම්බර් 30 දිනට පෙර සියළුම වැඩිහිටි නිවාස ලියාපදිංචි කල යුතු බවට තීරණය කිරීම, වැඩිහිටි සත්කාරක පුහුණු | ජාතික සභාව ගත් තීරණ කඩිනමින් ක්‍රියා මාර්ග ගෙන ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතන වල සහතික ලබාදීම හා පිළිගැනීම සම්බන්ධ ගැටළු ඇති වූ බව හා මානසික රෝගී වැඩිහිටියන් සඳහා උපදේශන සේවාවන් සැපයීම සඳහා අමාත්‍යාංශයෙන් ද විමසීම් සිදුකරන ලෙස අංගොඩ මානසික රෝහලෙන් දන්වා ඇති බව. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පනතේ 13 (ඔ) ප්‍රකාරව වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම හා ක්‍රියාවේ යෙදීම සභාවේ කාර්යයන් වුවත්, පසුගිය වර්ෂයේ සිට අවස්ථා 03 කදි වැඩිහිටි රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික සභාවේ සාමාජිකයින් විසින් යෝජනා ඉදිරිපත් කර තිබුණත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන තෙක් වැඩිහිටි රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග වැඩිහිටි රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා පවත්වා යෝජනා මේ වන විට දන්වා ඇති බව සහ ඒ සඳහා ජාතික සභා අනුමැතිය ලබාගැනීමෙන් පසු ආරම්භ කිරීමට නියමිතව ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | පනතේ 13 වගන්තියේ (ග) ප්‍රකාරව මහජනතාවගේ දැනගැනිම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහජ හැකියාවන් සහ දක්ෂතා ඇතුළත් කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මේ සඳහා අදාල ප්‍රාදේශිය බල මණ්ඩල හා ප්‍රාදේහිය ලේකම් කාර්යාලයෙහි වැඩිහිටි විෂය භාර නිලධාරින් ලබාගත් තොරතුරු එක්රැස් කර මේ වන විට ඊට අදාල දත්ත පද්ධතිය සකස් කරමින් පවතින බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව නාමාවලිය ක් පවත්වා ගත යුතුය. |
| (ඇ) | පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව සභාවේ ප්‍රධාන කර්තව්‍යය විය යුත්තේ ශ්‍රී ලංකාවේ සිටින වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහ වැඩිහිටි තැනැත්තන්ට ආත්ම ගෞරවයත්, ස්වාධීනත්වයත් හා ගරුත්වයක් ඇතිව ජීවත්වීම සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට 2016 වර්ෂයේදී ලද ප්‍රදාන රජයේ වාර්ෂික රු.2,438.715ක් වැයකර ඇතත් | ජාතික ප්‍රතිපත්තිය නැවත සංශෝධනය කිරීම සිදු කරන අතර අවසන් කෙටුම්පත මාස 03ක් ඇතුලත සකස් කර ලබා දීමට නියමිත බව . | පනතේ විධිවිධාන ප්‍රකාරව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක් සකස් කිරීම කඩිනම් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. ඉතිරි රු.1,807,092 ක්වූ මුදල පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 07 ක පමණ කාලයක සිට නිශ්කාර්යව රඳවාගෙන තිබුණි. | | කටයුතු කලයුතුය |
| (ඇ) | 13 වන (ඊ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාවේ කාර්යයක් වූ වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය, අභිමානය සහතික කිරීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවයකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මතාවයකින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැඩිහිටියන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය, වයස් ව්‍යුහය, සෞඛ්‍ය තත්ත්වය, ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා වැඩිහිටි ප්‍රජාවගේ තොරතරු ඇතුලත් නිසි ලෙස සකසන ලද යාවත් කාලීන වූ දත්ත පද්ධතියක් පිළියෙල කර නොතිබුණි. | 2023 ඔක්තෝබර් 01 සිට දත්ත පද්ධතියේ මූලික කටයුතු සිදුවෙමින් පවතින බව | පනතේ විධිවිධාන ප්‍රකාරව වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | පනතේ 34 වැනි වගන්තිය යටතේ සමාජ සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග 2 (1) යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා නේවාසික රැකවරණ සැලසීමේ අපේක්ෂිත යම් ආයතනයක් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ කටයුතු වල නිරත වී සිටින සෑම තැනැත්තෙකු හෝ සංවිධානයක් විසින්ම අදාළ ආයතනය තුල වැඩිහිටි තැනැත්තන් පස්දෙනෙකුට වඩා නේවාසිකව සිටින්නේ නම් වැඩිහිටි තැනැත්තන් සඳහා නේවාසික රැකවරණ සලසන එවැනි ආයතනයන් ලියාපදිංචි කිරීම කළ යුතු බව ගැසට් නිවේදනයකින් ප්‍රසිද්ධියට පත් කර වසර 11 ක් ගත වී තිබුණත් දැනට ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කරන වැඩිහිටි නිවාස 349 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර තිබුනේ නිවාස 113 ක් පමණි. | ඉතිරි සියළුම වැඩිහිටි නිවාස ලියාපදිංචිය මේ වන විට සිදු කරමින් පවතින බවත් කඩිනමින් එය අවසන් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව සියළුම වැඩිහිටි නිවාස ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාල යේ ලියාපදිංචි කල යුතුයි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කරගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 09 ක් වෙනුවෙන් රු.මිලියන 17.42 ක් භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණි. නමුත් මෙම වටිනාකමින් වැඩිහිටි සුභසාධන කටයුතු | වැඩසටහන් සියල්ල සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ තීරණ ගැනීම සම්බන්ධයෙන් පරිපාලන වියදම් හා නඩත්තු මණ්ඩලය පැවැත්වීම වෙනුවෙන් වියදම් කර ඇති බව හා සමාජ | අරමුණට අදාල වන පරිදි වියදම් සීමාව තුල කටයුතු කල යුතුය. |

සඳහා සෘජුවම වැය කර තිබුනේ රු. 5,719,495 ක් පමණක් වූ අතර ඉතිරිවූ රු 11,233,666 ක මුදල අධීක්ෂණය හා පරිපාලනය කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි. එය මුළු සුහසාධන වියදමෙන් සියයට 66 කි.

ආරක්ෂණ අරමුදලෙන් මෙම කාර්යයන් සඳහා අරමුදල් ලබා ගත නොහැකි බැවින් හා මෙම කාර්යයන් ද ආයතනය විසින් සිදු කළ යුතු ප්‍රධාන කාර්යයන් වන හෙයින් මෙම මුදල් වියදම් කර ඇති බව.